සිංහල

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்
அரசாங்க சேவை ஆணைக்குழு

PUBLIC SERVICE COMMISSION

OF

THE DEMOCRATIC SOCIALIST REPUBLIC

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
වැය ශීර්ෂ අංකය :- 06.

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

හැඳින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත **54(1)** අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ **19** වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු **2015.10.15** දින නව කොමිෂන් සභාව පත් කරන ලදී.

1.1. ආතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජාතියේ විශිෂ්ඨත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්

මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

අරමුණු

උපරිම කාර්ය සාධනය පවත්වා ගනිමින් සේවාලාභීන්ගේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම

1.2. ප්‍රධාන කාර්යයන්

01. රජයේ සේවයේ සෑම සේවාවක් සඳහාම සේවා ව්‍යවස්ථා සහ එම සේවාවන්ගෙන් පරිබාහිර සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් පටිපාටි, උසස් කිරීමේ පටිපාටි හා ස්ථාන මාරු පටිපාටි සැකසීම

02. ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අදාළ කටයුතු

03. අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම්, සේවයේ ස්ථිර කිරීම්. උසස් කිරීම්වලට අදාළ කටයුතු මෙන්ම මාණ්ඩලික නිලධාරීන්ගේ පත්කිරීම් හා උසස්කිරීම්වලට අදාළ සෞඛ්‍යසේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් පනවනු ලැබ ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

04. ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කිරීම.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරිම

06. බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරින් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

1.4 සංවිධාන සටහන

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය



02 පරිච්ඡේදය–ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය

<u>ආයතන අංශය</u>

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ආයතන අංශය පහත පරිදි කටයුතු කර ඇත.

බඳවාගැනීමේ පරිපාටි	52
සේවා ව්‍යවස්ථා	02
ස්ථානමාරු පරිපාටි	06
උසස්කිරීම් පරිපාටි	19
බඳවා ගැනීමේ පරිපාටි සංශෝධන	80
සේවා ව්‍යවස්ථා සංශෝධන	28
ස්ථානමාරු පරිපාටි සංශෝධන	09
උසස්කිරීම් පරිපාටි සංශෝධන	05
ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු	139
පොදු කරුණු	125
විශේෂ අවස්ථාවන්හිදී සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්	02
විශේෂ අවස්ථාවන්හිදී බඳවාගැනීමේ පරිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්	25
පරිපාලන බලතල පැවරීම	17
ශේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරිය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු	15
චක්‍රලේඛ	<u>04</u>
එකතුව	**<u>528</u>**

විනය අංශය

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විනය අංශය පහත පරිදි කටයුතු කර ඇත.

විනය කටයුතු අවසන් කිරීම් (මූලික විමර්ශන වාර්තාවෙන් පසුව/දීර්ඝ පිළිතුරෙන් පසුව)	13
චෝදනා පත්‍ර නිකුත් කිරීම	37
චෝදනා පත්‍ර සංශෝධනය කිරීම	06
විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම්	26
පරීක්ෂණ මණ්ඩලය සංශෝධනය කිරීම	05
චෝදනා වලින් නිදහස් කිරීම	09
සේවයෙන් පහ කිරීම	03
අනෙකුත් විනය දඬුවම්	22
විනය හේතු මත විශ්‍රාම ගැන්වීම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම	06
වැඩ තහනම් කිරීම	04
අනිවාර්ය නිවාඩු ගැන්වීම	01
වි. වැ.ව්‍ය. සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම	07
ස්ථාන මාරුකිරීම්	06
සේවයෙන් විශ්‍රාම ගැන්වීම්	08
විදේශ නිවාඩු අනුමත කිරීම	29
අභියාචනා ප්‍රතික්ෂේප කිරීම (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සඳහා)	08
අභියාචනා සඳහා එකඟවීම් (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සඳහා)	02
අභියාචනා ප්‍රතික්ෂේප කිරීම (සේවය හැරයාමේ නියෝග සඳහා)	10
අභියාචනා සඳහා එකඟවීම් (සේවය හැරයාමේ නියෝග සඳහා)	07
විනය පරීක්ෂණ නිලධාරීන් සංචිතයේ ලියාපදිංචි කිරීම්	02
අනෙකුත් සාමාන්‍ය නියෝග	221
පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ විභාග වන අභියාචනා සඳහා නිරීක්ෂණ	40

අධිකරණ අයදුම්පත් සඳහා නිරීක්ෂණ	10
පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ නියෝග ක්‍රියාත්මක කිරීම	209
ආයතන සංග්‍රයේ වගන්ති සංශෝධන	01
නැවත සේවයේ පිහිටුවීම	<u>06</u>
එකතුව	**<u>698</u>**

* ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් **17** ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

* අභියාචනාධිකරණ අයදුම්පත් **12** ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

* මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත් **03** ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

* පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයෙහි **(AAT)** විභාගයට ගැණුනු අභියාචනා **103**ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

පත්කිරීම් අංශ

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පත්කිරීම් අංශය පහත පරිදි කටයුතු කර ඇත.

විශ්‍රාම ගැන්වීම් (විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගැනිවීම් හැර)	11
ස්ථිර කිරීම්	565
බඳවා ගැනීම්	832
කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම්	923
කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම්	101
කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ	924
වැඩබැලීමට / රාජකාරී ඉටුකිරීමට පත් කිරීම්	1,124
මුදාහැරීම්	102
ඉල්ලා අස්වීම්	23
අන්තර්ග්‍රහනය කිරීම්	1,801
තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අදාල ඉල්ලීම් වලට ලබාදුන් පිළිතුරු	93
	6,499

උසස් කිරීම් අංශය

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ උසස් කිරීම් අංශය පහත පරිදි කටයුතු කර ඇත

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම්	550
තෝරා ගැනීම් මත උසස් කිරීම්	1,084
තනතුරු වලට පත් කිරීම්	528
වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමටපත් කිරීම් (ප්‍රාදේශීය ලේකම්)	81
තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අදාල ඉල්ලීම් වලට ලබාදුන් පිළිතුරු	72
	2,315

<u>අභියාචනා අංශය</u>

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ අභියාචනා අංශය පහත පරිදි කටයුතු කර ඇත.

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ලැබුණු අභියාචනා	2,091
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා බලය අභිනියෝජිත බලධරයන් වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවා ඇති අභියාචනා (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	1,135
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා කටයුතු නිම කළ අභියාචනා (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	2,395

<u>කටයුතු නිම කළ අභියාචනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.</u>

විනය කරුණු සම්බන්ධ අභියාචනා	318
උසස්වීම් සම්බන්ධ අභියාචනා	102
තනතුර අතහැරයාමේ නිවේදනය සම්බන්ධ අභියාචනා	523
ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා	1,198
පත්කිරීම් සම්බන්ධ අභියාචනා	6
වැඩ තහනම් කිරීම සම්බන්ධ අභියාචනා	32
වෙනත්	<u>216</u>
එකතුව	**<u>2,395</u>**

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ලැබුණු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන	06
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා නියෝග ලබා දී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන	04
2019.12.31 දිනට පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	44
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ලැබුණු අභියාචනාධිකරණ නඩු ගණන	02
2019.12.31 දිනට පවතින භියාචනාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	07

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ලැබුණු පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරී නඩු ගණන (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	91
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා තීරණ ලබා දී ඇති පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරී නඩු ගණන	120
2019.12.31 දිනට පවතින පරිපාලන අභියාචන විනිශ්වය අධිකාර නඩු ගණන (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව)	123
2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා ලැබුණු මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන	23

අධ්‍යාපන සේවා කමිටුව

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ අධ්‍යාපන සේවා කමිටුව පහත පරිදි කටයුතු කර ඇත.

විනය

චෝදනා පත්‍ර නිකුත් කිරීම	06
චෝදනා පත්‍ර සංශෝධනය කිරීම	02
අවසන් විනය නියෝග ලබාදීම	16
විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම	06
අනෙකුත් සාමාන්‍ය නියෝග	61
	91

පත් කිරීම් හා උසස් කිරීම්

බඳවා ගැනීම්	14
ස්ථිර කිරීම්	172
උසස් කිරීම්	814
විශ්‍රාම ගැන්වීම්	230
මුදා හැරීම්	104
අන්තර්ග්‍රහනය කිරීම්	458
කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ	208
නැවත සේවයේ පිහිටුවීම	01
තනතුරු වලට පත් කිරීම්	07
කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම්	01
රාජකාරි ආවරණයට පත්කිරීම්	01
ස්ථානමාරු	10
අනෙකුත් නියෝග	262
	2,282

දේශපාලන පළිගැනීම් සහන

අනෙකුත් නියෝග	07
	07

<u>සෞඛ්‍ය සේවා කමිටුව</u>

2019 වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සෞඛ්‍ය සේවා කමිටුව පහත පරිදි කටයුතු කර ඇත

විශ්‍රාම ගැන්වීම්	264
ස්ථිර කිරීම්	1,855
බඳවා ගැනීම්	3,566
2017 වර්ෂයට පෙර පත්කරන ලද වෛද්‍ය නිලධාරීන්ගේ අඩුපාඩු හේතු මත මෙතෙක් විධිමත් පත්වීම් ලිපි නිකුත් කර නොමැති වෛද්‍යවරුන් වෙත නිකුත් කල පත්වීම් ලිපි	27
විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම	460
උසස් කිරීම්	3,231
මුදා හැරීම	42
ස්ථාන මාරු කිරීම	5,169
ස්ථාන මාරු කිරීම සම්බන්ධ අභියාචනා	54
කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධ තීරණ	221
ඉල්ලා අස්වීම්	23
වැඩ බැලීම	59
චෝදනා පත්‍ර නිකුත් කිරීම	58
චෝදනා පත්‍ර සංශෝධනය කිරීම	04
චෝදනා වලින් නිදහස් කිරීම - විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව	05
චෝදනා වලින් නිදහස් කිරීම - චොදනා පත්‍රට දීර්ඝ පිළිතුර මත	05
චෝදනා වලින් නිදහස් කිරීම - චෝදනා පත්‍ර නිකුත් නොකොට	05
සෙසු විනය දඬුවම්	30
වි.වැ.ව්‍ය.සං.12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම	02
නැවත සේවයේ පිහිටුවීම	02
විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්ථනය කිරීම	02
අනිවාර්ය නිවාඩු ගැන්වීම	03
වැඩතහනම් කිරීම	01
අභියාචනා ප්‍රතික්ශේප කිරීම	08
විධිමත් විනය පරීක්ෂණය සඳහා පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම	25
අනෙකුත් සාමාන්‍ය නියෝග	103
වෙනත් නියෝග	12
	15,236

විශේෂ ජයග්‍රහන,

අදාල නොවේ

අභියෝග

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සැකසීම, පත්කිරිම්, උසස්කිරීම්, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විවිධාකාර රාජකාරිමය ගැටළු පැන නැගීම නිසා ප්‍රමාදයන් සිදුවීම

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා අගතියට පත්වන නිලධාරීන්ට සහන සැලසීම

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් පුද්ගලයින් විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ලබා දෙන ක්‍රියාත්මක කල නොහැකි තීරණ හා වැරදි සහගත අවස්ථාවන් ආශ්‍රිතව ගැටළුකාරී තත්ත්වයන් ඇතිවීම වැනි කරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මුහුන දෙන ප්‍රධාන අභියෝග ලෙස දැක්විය හැක.

ඉදිරි ඉලක්ක

උපරිම කාර්ය සාධනය පවත්වා ගනිමින් සේවාලාභීන්ගේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම තුලින් වඩාත් ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම

ප්‍ර.ග.නි./ ග.නි./ ආයතන ප්‍රධානියා

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9. රජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

03 පරිච්ඡේදය- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2019.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (2019 වර්ෂය)		සටහන	තත්‍ය 2019 වර්ෂය	2018 වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		241,882,000	308,970,000	**ඒසීඒ-3**
-	තැන්පතු		425,103	262,848	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		11,029,229	10,415,652	**ඒසීඒ-5/5(අ)**
-	වෙනත් ලැබීම්		9,482,278	6,995,892	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**262,818,610**	**326,644,392**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**262,818,610**	**326,644,392**	
	අඩු කළා: වියදම				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
161,000,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	156,759,965	136,507,709	**ඒසීඒ-2(II)**
60,930,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	57,381,031	46,322,014	
1,300,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,383,771	1,137,818	
-	පොළී ගෙවීම්	8	-	-	

-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
223,230,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**215,524,767**	**183,967,541**	
	මූලධන වියදම්				
1,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	**10**	1,180,995	978,420	
34,000,000	මූලධනවත්කම් අත්පත් කර ගැනීම	**11**	30,715,005	112,453,921	**ඒසීඒ-2(II)**
-	ප්‍රාග්ධන පැවරීම්	**12**	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
3,500,000	හැකියා වර්ධනය	**14**	3,032,713	1,615,038	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
38,600,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**34,928,713**	**115,047,379**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**14,921,121**	**26,889,279**	**ඒසීඒ-4**
	තැන්පතු ගෙවීම්		1,063,137	10,876,218	**ඒසීඒ-5/5(අ)**
	අත්තිකාරම් ගෙවීම්		13,857,984	16,013,061	
	මුළු වියදමළ = (ඇ+ඉ+ඊ)		265,374,601	325,904,199	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**(2,555,991)**	**740,193**	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2019 වර්ෂය	**2018 වර්ෂය**
		රු.	රු.
<u>**මූල්‍ය නොවන වත්කම්**</u>			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ-6**	807,838,672	704,602,093
<u>**මූල්‍ය වත්කම්**</u>			
අත්තිකාරම් ගිණුම්	**ඒසීඒ-5/5(අ)**	30,645,096	27,816,340
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසීඒ-3**	-	-
මුළු වත්කම්		**838,483,768**	**732,418,433**
<u>**ශුද්ධ වත්කම් / ස්කන්ධය**</u>			
ශුද්ධ වත්කම්		20,055,681	16,588,891
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		807,838,672	704,602,093
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(ආ)**		
<u>**ජංගම වගකීම්**</u>			
තැන්පතු ගිණුම්	**ඒසීඒ-4**	10,589,415	11,227,449
අග්‍රිම ශේෂය	**ඒසීඒ-3**	-	-
මුළු වගකීම්		**838,483,768**	**732,418,433**

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ-සී**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	සටහන		
		2019 වර්ෂය රු.	**2018 වර්ෂය** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදයම් නොවන ලැබීම්		5,630,958	308,970,000
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්		1,349,288	
අග්‍රිම ලැබීම්		241,882,000	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)		**248,862,246**	**308,970,000**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		218,172,153	183,760,346
සහනාධාර සහ මාරු කිරීම්වියදම්		1,383,771	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		695,558	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ)		**220,251,482**	**183,760,346**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ)=(අ)-(ආ)		**28,610,765**	**125,209,654**
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්</u>			
පොළී		1,244,032	1,019,313
ලාභාංශ		-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		1,258,000	1,290,170
උපණය අය කර ගැනීම		-	4,686,409
අත්තිකාරම් අය කර ගැනීම		8,060,006	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		**10,562,038**	**6,995,892**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජනඅත්පත් කර ගැනීම්		30,715,005	115,047,379
අත්තිකාරම් ගෙවීම්		7,819,763	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**38,534,768**	**115,047,379**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(27,972,730)**	**(108,051,487)**

(ඊ)=(ඈ)-(ඉ)		
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	**638,035**	**17,158,167**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	425,102	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූමුළු මුදල් ප්‍රවාහය (ඌ)	**425,102**	**-**
<u>***අඩු කළා - මුදල් වැය කිරීම්:***</u>		
දේශීය ණයආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,063,137	17,158,167
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**1,063,137**	**17,158,167**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(638,035)**	**(17,158,167)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.7වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	223,230	222,841	215,525	96.72
ප්‍රාග්ධන	38,600	38,989	34,929	89.59

3.8 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	අදාල නොවේ					

3.9මූලා නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූලා තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	570,551	570,551	-	100
9152	යන්ත්‍රෝපකරණ	117,788	117,788	-	100
9153	ඉඩම්	80,500	80,500	-	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	39,000	39,000	-	100

3.10විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේපීජ්/ඊ/පීඑස්සී/219/32 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජුනි 15 දින.

කාර්යාලය
16 JUN 2020
201214

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

Accf

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

ගිණුම් අංශය
17 JUN 2020
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.5.3.(ii)	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදි නොවීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතවල වටිනාකම නිවැරදි නොවුණි.	2019 ජනවාරි 01 දිනට දේපල පිරියත උපකරණ වටිනාකම නිවැරදි කිරීම.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 පුනරාවර්තන වියදම්

6-1-1-0-1506 දරන රජයේ නිලධාරීන් සඳහා දේපල ණය පොලී යන වැය විෂයයෙහි වියදම වූ රු. 1,383,771 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සහනාධාර , ප්‍රදාන හා මාරුකිරීම් යටතේ දැක්විය යුතු වුවත් එම වියදම පොලී ගෙවීම් යටතේ දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේපළ පිරියත හා උපකරණ වටිනාකම තුල රු.39,000,000 ක කල්බදු වත්කම් ඇතුළත් කර තිබියදී මූල්‍ය වත්කම් යටතේ කල්බදු වත්කම් ලෙසත් ශුද්ධ වත්කම් හා ස්කන්ධය යටතේ කල්බදු වත්කම් සංචිත ලෙසත් නැවත රු.39,521,040 ක් වාර්තා කර තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල කල්බදු වත්කම් ද්වීගණනයක් සිදු වී තිබුණි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ ශේෂය නිවැරදි නොවීම නිසා දේපළ පිරියත හා උපකරණ සංචිතයද නිවැරදි නොවුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි කල්බදු වත්කම් ලෙස රු.39,521,040 ක් (කල්බදු වටිනාකම හා මුද්දර ගාස්තුවෙහි එකතුව) නිවැරදිව දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි එය රු.39,000,000 ක් ලෙස (මුද්දර ගාස්තු රහිතව) දක්වා තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් 2019 ජූලි 25 දින සිදු කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරුවේදී වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ ඇති කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල තක්සේරු වටිනාකම රු.78,000 ක් වැඩියෙන් CIGAS මෘදුකාංගයට ඇතුලත් කිරීම නිසා කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම රු.78,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) කොමිෂන් සභාව සතුව පැවති රු.875,000 ක් පිරිවැය වූ වාහනයක් 2019 ජනවාරි 09 වන දින රු.1,258,000 කට විකුණා තිබුණු නමුත් මෙම වාහනය සම්බන්ධ තොරතුරු ආරම්භක ශේෂයේ හෝ අපහරණයන් යටතේ ඇතුලත් කර නොතිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් 2019 අගෝස්තු 01 දින පවත්වන ලද වෙන්දේසියේදී භාණ්ඩ වර්ග 09 ක් රු.1,212 ක වටිනාකමකට අපහරණය කර තිබුණි. තවද භාණ්ඩ 10 ක් විනාශ කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් අපහරණ යටතේ දක්වා නොතිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ දක්වා ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා වූ ආකෘති පත්‍රයට අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.8,224,278 ක් හා අග්‍රිම ලැබීම් ලෙස රු.241,882,000 ක් දක්වා එකතුව රු.250,106,278 ක් ලෙස දැක්විය යුතු වුවත් ආදායම් නොවන ලැබීම් යටතේ රු.241,882,000 ක් පමණක් දක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස එම අගයම දක්වා තිබුණි.

(ආ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා වූ ගෙවීම රු.218,172,153 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුල එය රු.215,342,217 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ සහනාධාර හා මාරු කිරීම් ලෙස රු.1,383,771 ක් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස රු.695,558 ක් දැක්විය යුතු වුවත් සහනාධාර සහ මාරු කිරීම් යටතේ රු.695,558 ක් පමණක් දක්වා තිබුණි.

1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ කොමිෂන් සභාව සතු වාහනයක් විකිණීමෙන් ලද රු.1,258,000 ක මුදල සටහන් විය යුතු වුවත් ඒ යටතේ රු.2,284,808 ක් දක්වා තිබුණි.

(ආ) චක්‍රලේඛයේ ආකෘතියට අනුව ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ලෙස රු.8,216,995 ක් දැක්විය යුතු වුවත් එම ලැබීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.30,715,005 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දැක්විය යුතු වුවත් එය රු.34,688,470 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) අත්තිකාරම් ගෙවීම් ලෙස රු.7,976,751 ක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ දැක්විය යුතු වුවත් එය අත්තිකාරම් ගෙවීම් ලෙස දක්වා නොතිබුණි.

1.6.3.3 මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

තැන්පතු ලැබීම් ලෙස රු.425,103 ක් හා මුදල් වැය කිරීම් යටතේ තැන්පතු ගෙවීම් ලෙස රු.1,063,137 ක් දැක්විය යුතු වුවත් තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් ලෙස රු.638,034 ක් දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වෙනත් නිරීක්ෂණ

(අ) කොමිෂන් සභාව සතු මෝටර් රථයක් 2019 දෙසැම්බර් 31 දින අනතුරට ලක්වීම නිසා ඇති වූ අලාභය රු.301,962 ක් ලෙස ඇස්තමේන්තු කර පැවතියද ඒ සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 2 (ii) ආකෘතියෙහි ඉතිරිය/(ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතු තීරුවේ එකතුව සඳහා සටහන් කර ඇති ප්‍රතිශතය නිවැරදි නොවිය. තවද ඒසීඒ 2 (iii) ආකෘතියෙහිද එකතුව සඳහා දක්වා ඇති ප්‍රතිශතයන් නිවැරදිව දක්වා නොතිබුණි.

(ඇ) 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුල 2018 වර්ෂයට අදාල දත්තයන් ඉදිරිපත් කිරීමේදී සංශෝධනය කරන ලද සංඛ්‍යාවන් දක්වා තිබුණි. නමුත් එසේ සංශෝධනය කළ අගයන් කිහිපයකට අදාල විස්තර පමණක් ඒසීඒ 6 ආකෘතියේ පහතින් දක්වා තිබුණු අතර සංශෝධනය කරන ලද අනෙකුත් සංඛ්‍යාවන් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

6-1-1-0-2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම ප්‍රාග්ධන වැය විෂයය යටතේ වූ රු.500,000 ක මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම 6-1-1-1-2104 දරන ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමද, 6-1-1-0-1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂයෙහි මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම 6-1-1-0-1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා යන වැය විෂයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමද කර තිබුණි. තවද 6-1-1-0-1203 වැය විෂයයේ මුළු ප්‍රතිපාදනයෙන් 62% ක් 6-1-1-0-2003 දරන වැය විෂයය වෙත මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි පරිදි පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 1647(ආ)	වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් කොමිෂන් සභාව විසින් සිදුකර නොතිබුණි.
(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.1.1 සිට 3.1.6 දක්වා වගන්ති	2018 වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නිම කර අදාල සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඒ බව 2019 මාර්තු මස 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 අගෝස්තු 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.
(ii) 3.1.4 ඡේදය	සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියා මාර්ග ගැනීම සිදු කල යුතු නමුත් එම ඌනතා හා අතිරික්තතා සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(iii) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 03 ඡේදය	2019 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ඈ) **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

(i) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	2019 වර්ෂය අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා නොතිබුණි.

(ඇ) **ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ**

4.2.1 ආකෘතිය	කොමිෂන් සභාව සකස් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ ආකෘතියේ මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රසම්පාදන වර්ගය පැහැදිලිව දක්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එම්.ජී.බී.ජී.බී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
	අදාල නොවේ		

05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%- 100%**
	අදාල නොවේ				

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	52	47	05
තෘතීයික	11	05	06
ද්විතියික	118	116	02
ප්‍රාථමික	54	46	08

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

කාර්යාලයේ රාජකාරි දැනට සේවයේ නියුතුව සිටින කාර්ය මණ්ඩලය තුල බෙදාහැර ඉටු කරවා ගැනීමට කටයුතු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
අභ්‍යන්තර විගණනය පාදක අභ්‍යන්තර විගණන සැලසුම්	01	දින 01	7	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
විනය කාර්ය පටිපාටිය	02	දින 03	30	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
රජයේ වැටුප් මෘදුකාංගය සම්බන්ධ පුහුණුව	02	දින 03	36	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
රාජ්‍ය මුදල් රෙගුලාසි	01	දින 03	18	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	02	අවු.01	199	-	දේශීය	සේවා ව්‍යවස්ථා අවශ්‍යතා සපුරා ලීම.
අර්ථික විද්‍යාව පිළිද ශාස්ත්‍රපති උපාධිය	02	අවු. 02	250	-	දේශීය	සේවා ව්‍යවස්ථා අවශ්‍යතා සපුරා ලීම.
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රති උපාධිය	01	අවු. 02	220	-	දේශීය	සේවා ව්‍යවස්ථා අවශ්‍යතා සපුරා ලීම.

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	01	අවු. 02	125	-	දේශීය	සේවා ව්‍යවස්ථා අවශ්‍යතා සපුරා ලීම.
මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව	57	දින 02	57	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුළුව	74	දින 02	32	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
කණිෂ්ඨ කාර්යමණ්ඩල පුහුණුව	30	දින 02	35	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම.
ප්‍රම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	48	දින 01	2	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම
ධාරිතා සංවර්ධන පුහුණුව	42	දින 03	532	-	දේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම
ධාරිතා සංවර්ධන පුහුණු වැසටහන	01	දින 05	-	139	විදේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම
අධ්‍යයන චාරිකා වැඩසටහන	02	දින 07	-	644	විදේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම
අධ්‍යයන චාරිකා වැඩසටහන	05	දින 05	-	45	විදේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම

ඵලදායිතා වර්ධනය සහ තරඟකාරීත්වය පිළිබඳ වැඩමුළුව.	01	දින 07	-		විදේශීය	දැණුම සහ හැකියාව වර්ධනය තුළින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හාලේඛනනඩත්තුකිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයටයටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
04	**වාර්ෂික සැලසුම්සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		

4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලනොවේ	නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇතත් වෙන්දේසි කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් අවසන් වාර්ථා ප්‍රමාදවී ඉදිරිපත්කර ඇත.	වාර්ෂික සැලැස්ම අනුව කටයුතු සිදුකිරීම
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලනොවේ	නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇතත් වෙන්දේසි කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් අවසන් වාර්ථා ප්‍රමාදවී ඉදිරිපත්කර ඇත	වාර්ෂික සැලැස්ම අනුව කටයුතු සිදුකිරීම
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලනොවේ	මිලගණන් ඉදිරිපත්කළ ගැණුම් කරුවන් ඉදිරිපත් නොවීම හා නැවත මිලගණන් කැඳවා අපහරන කටයුතු සිදුකිරීම. (ආයතනයේ පාලනයෙන් තොර හේතුවක් නිසා මෙසේ ප්‍රමාද වී ඇත)	අදාල නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූලවේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලවේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූලවේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූලවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		

අවසානය.